# මහින්ද රාජපක්ෂ විද්‍යාලය - හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2011

## බුද්ධ ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

නම/විභාග අංකය :..........................................................................................................

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**1 කොටස**

1. සිදුහත් තාපසතුමාගේ ගුරුවරයෙකු වන්නේ මින් කවරෙක්ද?
   i. අසිත තවුසා ii. ආලාරකාලාම තවුසා
   iii. සර්වමිත්‍ර බමුණා iv. කොණ්ඩඤ්ඤ බමුණා

2. වාචසික අකුසලයක් නොවන්නේ මින් කුමක්ද?
   i. බොරු කීම ii. කේලාම් කීම
   iii. පරුෂ වචන කීම iv. සොරකම් කිරීම

3. රාහුල හාමුදුරුවන් රහත්භාවය ලැබුවේ මින් කුමන සූත්‍රය ඇසීමෙන්ද?
   i. චුල්ල රාහුලෝවාද සූත්‍රය ii. අනන්ත ලක්ඛණ සූත්‍රය
   iii. කරණීය මෙත්ත සූත්‍රය iv. දම්සක් පැවතුම් සූත්‍රය

4. ශීලයට අයත් ආර්ය මාර්ග අංගයක් නොවන්නේ
   i. සම්මා වාචා ii. සම්මා කම්මන්ත
   iii. සම්මා වායාම iv. සම්මා ආජීව

5. ධම්ම පදයට අයත් වන ගාථා ප්‍රමාණය
   i. 234 ii. 324
   iii. 423 iv. 426

6. බුදු ගුණ අලංකාරය කව්පොත රචනා කලේ,
   i. තොටගමුවේ රාහුල හිමි ii. විදාගම මහා මෛත්‍රී හිමි
   iii. කුමාරතුංග මුනිදාස කවියා iv. විමලසේන කුමාරගම කවියා

7. ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලයට අයත් නොවන්නේ,
   i. තමා වැරදි කිරීමෙන් වැලකීම ii. අනුන් ලවා වැරදි කරවීමෙන් වැලකීම
   iii. අනුන්ට වැරදි කිරීමට අනුබල දීමෙන් වැලකීම iv. අනුන් වැරදි කිරීමෙන් මුදවා ගැනීම

8. " නහී වේරේන වේරානි " යන ධම්ම පද ගාථාවෙන් පැවසෙන්නේ,
   i. වෛරයෙන් වෛරය සංසිඳෙන බවයි ii. වෛරයෙන් වෛරය නොසංසිඳෙන බවයි
   iii. සියළු දෙනා ජීවිතයට ප්‍රිය බවයි iv. සියළු දෙනා මරණයට බිය බවයි

9. අංගුලිමාල දමනයෙන් පිළිබිඹු වන බුදු ගුණය වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | අරහං | ii. | සුගතෝ |
| iii. | පුරිස ධම්ම සාරථී | iv. | භගවා |

10. ප්‍රිය වචන කථා කිරීමේ වැදගත්කම පිළිබඳ කියවෙන ජාතක කථාව වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | නන්දි විසාල | ii. | අපණ්ණක |
| iii. | වණ්ණුපථ | iv. | දීඝායු |

11. දියුණු වීමේ දොරටුවක් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | කායික නිරෝගී කම | ii. | මානසික නිරෝගී කම |
| iii. | ගුරු අවවාද ලබා ගැනීම | iv. | කීකරු කම |

12. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් අයත් වන්නේ කුමන දිශාවටද?

| | | | |
|---|---|---|---|
| i. | උතුර | ii. | දකුණ |
| iii. | නැගෙනහිර | iv. | බටහිර |

13. දෙමාපියන් විසින් දරුවන්ට ඉටුකල යුතු යුතුකමක් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | සුදුසු කල ආවාහ විවාහ කර දීම | ii. | සුදුසුකල දායාද පැවරීම |
| iii. | යහපතෙහි යෙදවීම | iv. | රැකියාවක් සොයා දීම |

14. බුදුන් වහන්සේ සම්මා සම්බුද්ධ ලෙස හඳුන්වන්නේ

i. රහසින් වත් පව් නොකල නිසා
ii. අතීත,වර්තමාන,අනාගත කාල පිළිබඳ මැනවින් දත් නිසා
iii. සොඳුරු බස් කියූ නිසා
iv. බඹසර යකුන් දමනය කළ නිසා

15. පන්සිල් වලට අයත් නොවන්නේ මින් කුමක්ද?

| | | | |
|---|---|---|---|
| i. | සතුන් මැරීමෙන් වැලකීම | ii. | සොරකමෙන් වැලකීම |
| iii. | විකාල බෝජනයෙන් වැළකීම | iv. | බොරු කීමෙන් වැලකීම |

16. තමන් උසස් කොට සැලකීම

| | | | |
|---|---|---|---|
| i. | ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලයයි | ii. | අත්තුක්කංසනයයි |
| iii. | අත්තුපනායික ධම්මයයි | iv. | පරවම්භනයයි |

17. සතර සංග්‍රහ වස්තු වලට අයත් නොවේ.

| | | | |
|---|---|---|---|
| i. | දානය | ii. | ප්‍රියවචනය |
| iii. | ශීලය | iv. | සමානාත්මතාවය |

18. සියළු කෙලෙසුන් නැසීමේ නුවණ,

| | | | |
|---|---|---|---|
| i. | පුබ්බේ නිවාසානුස්සතී ඥානයයි | ii. | චුතුපපාත ඥානයයි |
| iii. | ආසවක්ඛ්‍ය ඥානයයි | iv. | දිබ්බසෝත ඥානයයි |

19. මහාභිනිෂ්ක්‍රමණය සිදුවූයේ,

i. දුරුතු පෝය දිනයකය  ii. වෙසක් පෝය දිනයකය
iii. පොසොන් පෝය දිනයකය  iv. ඇසළ පෝය දිනයකය

20. පන්සලට ගිය විට වන්දනා කල යුතු ස්ථාන පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. බෝධිය, චෛත්‍ය, විහාරය  ii. බෝධිය, විහාරය, චෛත්‍ය
iii. චෛත්‍ය, බෝධිය, විහාරය  iv. චෛත්‍ය, විහාරය, බෝධිය

## II කොටස

1. පසුගිය දා පැවති 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති වෙසක් සතිය නිමිත්තෙන් මහින්ද රාජපක්ෂ විද්‍යාලය නොයෙකුත් වැඩ වැඩටහන් සංවිධානය කර තිබුණි. ආමිස හා ප්‍රතිපත්ති පූජාවන් මුල් කර ගෙන සංවිධානය කරන එම වැඩ සටහනෙහි ඔබ සහභාගී වූ ක්‍රියාකාරකම් ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   i. 2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් පාසල සංවිධානය කල වැඩ සටහන් අතුරෙන් 4 ක් ලියන්න.
   ii. එම වැඩ සටහන් අතුරින් වඩාත්ම ඔබේ සිත්ගත් අංග 02 ක් ලියන්න.
   iii. එම වැඩසටහන් වලට සහභාගී වීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 04 ක් ලියන්න.
   iv. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඔබ මුහුණ දුන් දුෂ්කරතා 02 ක් ලියන්න.
   v. විද්‍යාලයීය බෞද්ධ සංගමය සංවිධානය කරන ලද එම වැඩසටහන් වලට සහභාගී වීමෙන් ඔබ ලබාගත් විශේෂ හැකියාවන් 02 ක් ලියන්න.

2.
   i. ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 03 ක් ලියන්න.
   ii. ආත්ම ගණනක් වෛරයෙන් සිට බුදුන් වහන්සේ නිසා වෛරය නැති කර ගත් කාන්තාවකගේ හා යක්ෂණියකගේ කථාව කෙටියෙන් ලියන්න.

3.
   i. ඔබ පන්සලට යනවිට ගෙනයන දේවල් 03 ක් නම් කරන්න.
   ii. තිසරණ නම් කරන්න.
   iii. පෙහෙවස් සමාදන් වන දිනක ඔබ අනුගමනය කරන විශේෂ හැසිරීම් විධි මොනවාද?

4.

i. ශීලය යනු කුමක්ද?

ii. ධම්මපද ගාථා ඉගෙනීමෙන් ඔබට ගත හැකි ප්‍රයෝජන මොනවාද?

iii. මෙම ධම්මපද ගාථාව සම්පූර්ණයෙන් නැවත ලියන්න.

.......................................................

සබ්බේ භායන්ති මච්චුනෝ

.......................................................

.......................................................

5.

i. සිව්බඹ විහරණ නම් කරන්න

ii. සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන් විසින් දෙමාපියන්ට ඉටුකල යුතු යුතුකම් වලින් 03 ක් ලියන්න.

iii. යහපත් දරුවෙකු ලෙස ඔබ ඔබේ දෙමාපියන්ට දැනට ඉටුකර දෙන හා අනාගතයේදී ඉටුකර දීමට අපේක්ෂිත යුතුකම් 03 බැගින් වගු ගත කරන්න.

6.

i. තුන් දොර නම් කරන්න

ii. දියුණු වන පුද්ගලයෙකු අවවාද ලබා ගත යුතු ගුරුවරු නම් කරන්න.

iii. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන මොනවාද?